# 07 – මූලද්‍රව්‍ය හා සංයෝග ප්‍රමාණනය

10 ශ්‍රේණිය - විද්‍යාව - 1වන සතිය

**ඔබේ විද්‍යාව පෙළපොතෙහි "මූලද්‍රව්‍ය හා සංයෝග ප්‍රමාණනය" නමැති ඒකකය හොඳින් කියවා පහත අභ්‍යාසවල යෙදෙන්න.**

**අභ්‍යාස**

01. පහත දැක්වෙන සංයෝගවල සාපේක්ෂ අණුක ස්කන්ධ හා මවුලික ස්කන්ධ සොයන්න.

i. $CO_2$ (කාබන් ඩයොක්සයිඩ්)
ii. $NaCl$ (සෝඩියම් ක්ලෝරයිඩ්)
iii. $CaCO_3$ (කැල්සියම් කාබනේට්)
iv. $NH_4Cl$ (ඇමෝනියම් ක්ලෝරයිඩ්)
v. $Mg_3N_2$ (මැග්නීසියම් නයිට්‍රයිඩ්)
vi. $H_2S$ (හයිඩ්‍රජන් සල්ෆයිඩ්)
vii. $AlCl_3$ (ඇලුමිනියම් ක්ලෝරයිඩ්)
viii. $(NH_4)_2CO_3$ (ඇමෝනියම් කාබනේට්)
ix. $CuSO_4$ (කොපර් සල්ෆේට්)
x. $Na_2C_2O_4$ (සෝඩියම් ඔක්සලේට්)

i. $CH_3OH$ (මෙතිල් ඇල්කොහොල් / මෙතනෝල්)
ii. $CS_2$ (කාබන් ඩයිසල්ෆයිඩ්)
iii. $C_8H_{18}$ (ඔක්ටේන්)
iv. $CH_3COOH$ (ඇසිටික් අම්ලය)
v. $C_{12}H_{22}O_{11}$ (සුක්‍රෝස්)
vi. $CO(NH_2)_2$ (යූරියා)
vii. $C_9H_8O_4$ (ඇස්පිරින්)
viii. $HNO_3$ (නයිට්‍රික් අම්ලය)
ix. $CCl_4$ (කාබන් ටෙට්‍රාක්ලෝරයිඩ්)
x. $C_8H_9NO_2$ (පැරසිටමෝල්)

(සා.ප.ස: H - 1, C - 12, N - 14, O - 16, Na - 23, Mg - 24, Al - 27, S - 32, Cl - 35.5, S - 32)

1. සෝඩියම් ඔක්සලේට් ග්‍රෑම් 67ක අඩංගු,
   a. සෝඩියම් ඔක්සලේට් මවුල ගණන
   b. ඔක්සිජන් මවුල ගණන
   c. මුලු පරමාණු මවුල ගණන
   d. කාබන් පරමාණු ගණන සොයන්න.

2. ඇමෝනියම් කාබනේට් මවුල 2.5ක,
   a. ස්කන්ධය
   b. අඩංගු හයිඩ්‍රජන් පරමාණු සංඛ්‍යාව
   c. මුලු පරමාණු මවුල ගණන සොයන්න.

3. වේදනා නාශක ලෙස ලබාගන්නා පැරසිටමෝල් පෙත්තක අඩංගු පැරසිටමෝල් ස්කන්ධය මිලිග්‍රෑම් 500කි. එම පෙත්තක අඩංගු පැරසිටමෝල් මවුල ගණන සොයන්න. ඒ ඇසුරින් එහි අඩංගු එක් එක් මූලද්‍රව්‍ය මවුල සංඛ්‍යා සොයන්න.


සැකසුම - D.D. ඥානරත්න - දෙහිඕවිට අධ්‍යාපන කලාපය